දේශපාලන විදුහ

1 වෙළුම, 1 කලාපය, 2015

දේශපාලන විද්‍යා ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය

දේශපාලන විද්‍යා ශිෂ්‍ය සංගමය
ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය

දේශපාලන විද්‍යා
ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය

2015 නොවැම්බර්

පළමු වෙළුම පළමු කලාපය

දේශපාලන විද්‍යා ශිෂ්‍ය සංගමය
ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

දේශපාලන විද්‍යා ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය 2015

ප්‍රකාශනය

දේශපාලන විද්‍යා ශිෂ්‍ය සංගමය
ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

මුද්‍රණය- 2015 නොවැම්බර්
ISSN 2465-6321

© දේශපාලන විද්‍යා ශිෂ්‍ය සංගමය, කැලණිය විශ්වවිද්‍යාලය

පිටකවර නිර්මාණයෑ උදයන්ත පුෂ්පනාත්, සිව්වන වසර

දේශපාලන විද්‍යා ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය සඳහා මූල්‍ය අනුග්‍රාහකත්වය
කැලණිය විශ්වවිද්‍යාලයීය උපකුලපති අරමුදල

උපකුලපතිතුමාගේ පණිවුඩය

කැලණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා ශිෂ්‍ය සංගමය විසින් ප්‍රථම වතාවට එළිදක්වනු ලබන දේශපාලන විද්‍යා **'ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය'** වෙනුවෙන් මාගේ ශුභාශිංසන පළමුව පිරිනැමීමට කැමැත්තෙමි.

මෙබඳු ශාස්ත්‍රීය ලිපි සංග්‍රහ මඟින් අප විද්‍යාර්ථීන්ගේ පර්යේෂණ හා ලේඛන කුසලතා වර්ධනය කර ගැනීමට මනා ප්‍රවේශයක් ලබා දෙන බව මාගේ විශ්වාසයයි. දේශපාලනික, සාමාජික හා ආර්ථික තත්වයන්ගේ නව ප්‍රවණතා පිළිබඳව විමර්ශනාත්මකව හා නව දෘෂ්ටිකෝණවලින් දැනුම ගවේෂණය කිරීමට උත්සුක වීම සඳහා ද විද්‍යාර්ථීන්ගේ ශාස්ත්‍රීය හා පර්යේෂණ කටයුතු ඔප්නැංවීම සඳහා ද, මෙබඳු ශාස්ත්‍රීය කටයුතු සිදු කිරීම යුගයේ අවශ්‍යතාවක් ලෙස අවධාරණය කළ හැකි ය. විශ්වවිද්‍යාල ශිෂ්‍යයා නිරන්තරයෙන් ම පර්යේෂකයෙකු, ගවේෂකයෙකු වීම අත්‍යවශ්‍ය වන්නා සේ ම ස්වකීය දැනුම මෙසේ ශාස්ත්‍රීය ක්‍රමවේද ඔස්සේ සමාජගත කිරීම ද අත්‍යවශ්‍ය වේ. මෙම කර්තව්‍යය සාර්ථකව නිම කිරීමට උරදුන් සියලු දෙනා වෙත මාගේ හෘදයාංගම සුභාශිංසන පිරිනමමි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනන්ද මද්දුම බණ්ඩාර
උපකුලපති
කැලණිය විශ්වවිද්‍යාලය

පීඨාධිපතිතුමාගේ පණිවුඩය

කැලණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා ශිෂ්‍ය සංගමය විසින් තම පළමු ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය මුද්‍රණයෙන් එළි දක්වනු ලබන මෙම අවස්ථාවේ ඒ වෙනුවෙන් මාගේ සුභාශිංෂණය පිරිනැමීමට කැමැත්තෙමි. තම අධ්‍යයන පාඨමාලාව තුළින් උකහාගත් දැනුම උපයෝගී කරගනිමින් කාලීන සමාජ, ආර්ථික, දේශපාලනික ගැටලු විග්‍රහ කරමින් දේශපාලන විද්‍යා (විශේෂ) උපාධි පාඨමාලාව හදාරන සිසු සිසුවියන් විසින් සකස් කරන ලද මෙම ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය තුළින් ඔවුන්ගේ පර්යේෂණාත්මක හැකියාව විදහා දක්වනු ලබයි. විශ්වවිද්‍යාලය තුළ උපාධි පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන් තම පාඨමාලාවට අමතරව විෂයානුබද්ධ සහ වෙනත් බාහිර ක්‍රියාකාරකම්වල නිරතවීම තුළින් තම උපාධි පාඨමාලාවේ ගුණාත්මකභාවය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. දේශපාලන විද්‍යා ශිෂ්‍ය සංගමය විසින් එළි දක්වනු ලබන මෙම ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය ඒ සඳහා දැරූ ප්‍රයත්නයක් ලෙසින් අගය කරමි.

මහාචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න
පීඨාධිපති
සමාජීය විද්‍යා පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය

අංශාධිපතිතුමාගේ පණිවුඩය

කැලණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා ශිෂ්‍ය සංගමය විසින් පළමු වරට ශාස්ත්‍රීය ලිපි සංග්‍රහයක් එළදැක්වීමට කටයුතු කිරීම අගය කරමි. විශේෂයෙන්ම දේශපාලන විද්‍යා ශාස්ත්‍රවේදී විශේෂ පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන්ගේ කුසලතා මුත් නැංවූ අවස්ථාවක් ලෙස මෙය අගය කොට සලකමි. ස්වකීය දැනුම හා චින්තන ශක්තිය විවිධ මානයන් ඔස්සේ විවර කරමින් තම ශාස්ත්‍රීය කටයුතුවල හරය මෙලෙස ලිපි සංග්‍රහයක් තුළින් සාර්ථකව ඉදිරිපත් කර තිබීම දේශපාලන විද්‍යා ශිෂ්‍ය සංගමයේ සාර්ථකත්වයට නිතැතින්ම හේතු වනු ඇත. මෙම ශාස්ත්‍රීය කටයුත්ත සාර්ථකව නිම කර ගැනීම සඳහා නිවැරදි මග පෙන්වීම ලබා දෙමින් විද්‍යාර්ථීන් දිරිමත් කළ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ දේශපාලන විද්‍යා ශිෂ්‍ය සංගමයේ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික එම්.කේ. නදිකා දමයන්ති මෙනවියට මාගේ කෘතඥතාව පුද කරමි. එමෙන්ම මෙය කටයුත්ත සාර්ථක කර ගැනීම සඳහා නන් අයුරින් සහයෝගය ලබා දුන් සියලුම ආචාර්යවරුන්ටත්, මෙම ශාස්ත්‍රීය සංග්‍රහය මුද්‍රණය කිරීම සඳහා අවශ්‍ය මූල්‍යමය අනුග්‍රහය දැක්වූ කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති අරමුදලටත් මාගේ කෘතඥතාව පළ කරමි.

මහාචාර්ය උපාලි හෙට්ටිආරච්චි
අංශාධිපති
ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

ප්‍රධාන සංස්කාරකගේ පණිවුඩය

'දේශපාලන විද්‍යා ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය' මුද්‍රණය කොට එළි දැක්වීම කැලණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා ශිෂ්‍ය සංගමය විසින් 2013/2014 අධ්‍යයන වර්ෂය තුළ අධ්‍යයන පාඨමාලාවට සමගාමීව ඉටු කරනු ලැබූ ශාස්ත්‍රීය වැඩකටයුතු අතුරින් එක් කාර්යයකි. මෙම ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය කැලණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා (විශේෂ) පාඨමාලාව හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පර්යේෂණ සහ ලේඛන කුශලතා එළි දැක්වෙන එක් අවස්ථාවකි. ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය තුළ දේශපාලන විද්‍යා විෂයය ආරම්භ කර වසර ගණනාවක් ගතවී ඇති මොහොතක දේශපාලන විද්‍යා පාඨමාලාව හදාරනු ලබන සිසුන් විසින් ප්‍රථම වතාවට තම ශාස්ත්‍රීය සහ පර්යේෂණ දැනුම උපයෝගී කරගනිමින් ශාස්ත්‍රීය ලිපි සංග්‍රහයක් සකස් කොට මුද්‍රණය කිරීමේදී ඒ සඳහා මාර්ගෝපදේශකත්වය ලබාදීමට ලැබීම භාග්‍යයක් කොට සලකමි. මෙම කාර්යය සාර්ථක කරගැනීම සඳහා සහාය දැක්වූ උපකුලපතිතුමා, පීඨාධිපතිතුමා, අංශාධිපතිතුමා ඇතුළු අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයටත් ලිපි සැපයීමෙන් දායක වූ සියලු ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටත් ස්තුතිය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

එම්.කේ. නදීකා දමයන්ති
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය

සංස්කාරකගේ පණිවුඩය

විශ්වීය දැනුම ගවේෂණය කරන්නා වූ නවමු මානයන් ඔස්සේ ලෝකය අර්ථකතනය කරන්නා වූ විශ්වවිද්‍යාල ශිෂ්‍යයා නිතැතින්ම නිර්මාණශීලී විය යුතුය. අත්‍යවශ්‍යයෙන්ම දේශපාලන, සමාජ ,ආර්ථික තත්ත්ව පිළිබඳව පමණක් නොව සෑම අංශයක් කෙරෙහිම ස්වකීය තීක්ෂණ අවධානය යොමු කළ යුතුවාසේම සමාජය ගවේෂණය කරන පර්යේෂකයෙකු විය යුතුය. එවිට නිසැකවම සිව්වසරක විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ අරුත කැටිකරගත් බුද්ධිමතෙකු බිහි වනු නොඅනුමානය. විශේෂයෙන්ම කැලණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා විශේෂ පාඨමාලාව හදාරන ශිෂ්‍යයන් ලෙස ස්වකීය ශාස්ත්‍රීය පර්යේෂණ කටයුතු අතර ප්‍රථම වතාවට එළි දක්වන ශාස්ත්‍රීය සංග්‍රහය ඔවුන්ගේ ගවේෂණාත්මක නිර්මාණශීලී ලේඛන කෞෂල්‍ය මනාව ප්‍රකට වූ අවස්ථාවක් ලෙස මා දකිමි. විශේෂයෙන්ම දේශපාලනයේ සැඟවුනු යථාර්ථයන් ස්වකීය දෘෂ්ටියෙන් විග්‍රහ කිරීමේ අපූරු කලාවක් ඔවුන් සතු බව මෙම ශාස්ත්‍රීය සංග්‍රහය පරිශීලනය කිරීම තුළින් නිසැකවම ප්‍රත්‍යක්ෂ වේ. දේශපාලන විද්‍යා ශිෂ්‍ය සංගමය වශයෙන් එකමුතුව සියලුම ශිෂ්‍යයින්ගේ නොමඳ සහයෝගය ලැබීමත්, ශිෂ්‍ය සංගමයේ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නදීකා දමයන්ති මෙනවියගේ මග පෙන්වීමත් නිසා මෙය ඉතා සාර්ථකව එළිදැක්වීමට හැකි වූ බව මෙහිදී මතක් කිරීමට කැමැත්තෙමි. දේශපාලන විද්‍යා ශිෂ්‍ය සංගමය වශයෙන් අප දැරූ උත්සහයේදී සහයෝගය ලබා දුන් සියලුම දෙනාට මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

දර්ශන විජේතුංග
දේශපාලන විද්‍යා (විශේෂ) තෙවන වසර
ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය

ලිපි විමර්ශනය සඳහා දායකත්වය

යමුනා නෙරංජනී මෙන්ඩිස්
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

එම්.කේ. නදීකා දමයන්ති
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

ආචාර්ය චාමින්ද අබේසිංහ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

ප්‍රියන්ත මුදලිගේ
ආධුනික කථිකාචාර්ය
ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

පී.ඩබ්. සිතාර ප්‍රියදර්ශන
ආධුනික කථිකාචාර්ය
ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය